ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 ඔක්තෝබර් මස 09 වැනි දින |

## 2014 අගෝස්තු මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

### සමස්ත නිරීක්ෂණ

**2014 අගෝස්තු මාසයේ දී අපනයන ආදායම තවදුරටත් වර්ධනය වීමත් සමග විදේශීය අංශයේ වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි.** ආනයන වියදම ද වසරේ අනුගාමී දෙවන මාසයටත් ඉහළ යාමක් වාර්තා කළේය. 2014 වසරේ පළමු මාස අට තුළ දී සමුච්චිත වෙළෙඳ හිඟය, 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේදී අඩු අගයක් ගත් අතර, එය ගෙවුම් තුලනයේ ජංගම ගිණුම වර්ධනය වීමට හේතු විය. ජංගම ගිණුමේ මෙම වර්ධනය ද සමග මූල්‍ය ගිණුම වෙත වූ අඛණ්ඩ ලැබීම් 2014 වසරේ පළමු කාර්තුව තුළ දී ගෙවුම් තුලනයේ අතිරික්තය සඳහා හේතු වූ අතර, එමගින් ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකය ශක්තිමත් විය.

### අපනයන ක්‍රියාකාරිත්වය

**2014 අගෝස්තු මාසයේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 991 ක් දක්වා සියයට 7.9 කින් වර්ධනය වූ අතර සමුච්චිත අපනයන ආදායම 2014 වසරේ පළමු මාස අට තුළ දී එ.ජ.ඩොලර් මිලියන 7,385 ක් දක්වා සියයට 14.8 කින් වර්ධනය විය.** 2014 අගෝස්තු මාසයේ දී අපනයන ආදායමේ වර්ධනය සඳහා රෙදිපිළි හා ඇඟළුම්, ප්‍රවාහන උපකරණ සහ පොල් නිෂ්පාදන යන ප්‍රධාන අපනයන කාණ්ඩයන් දායක විය. මුළු අපනයනයන්ගෙන් සියයට 85 කට පමණ දායකත්වයක් ලබා දෙන රෙදිපිළි හා ඇඟළුම් අපනයන සිය වර්ධනය වීමේ ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා

ගනිමින් 2014 අගෝස්තු මාසයේ දී ඉහළ අනුපාතයකින් වර්ධනය විය. නවීන විලාසිතා අනුව නිම වූ කාන්තා හා ළමා යට ඇඳුම් අපනයනයෙහි වූ සීඝ්‍ර වර්ධනය මෙම අංශයේ අපනයන වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. තවද, මගී ප්‍රවාහන නෞකාවක් අපනයනය හේතුවෙන් ප්‍රවාහන උපකරණ අපනයනය විශාල වශයෙන් වැඩි වූ අතර පොල් අපනයන ආදායම සඳහා ප්‍රධාන වශයෙන් පොල් මද නිෂ්පාදිත අපනයනවල කැපී පෙනෙන ඉහළයාම හේතු විය. කෙසේ වුවද, කලාපීය තරගකරුවන් වෙතින් පවතින තියුණු තරගකාරිත්වය පිළිබිඹු කරමින් ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා වැඩි දායකත්වයක් ලබා දෙන නැව් සහ ගුවන් යානා ඉන්ධන අපනයන තවදුරටත් අඩු විය. තවද, ප්‍රධාන දියමන්ති අපනයනකරුවකුගේ නිෂ්පාදන කටයුතු මෙම කාලපරිච්ඡේදය තුළ සිදු නොවුණු බැවින් දියමන්ති අපනයන ආදායම අඩු වූ අතර මෙම වසර තුළ දී නිෂ්පාදන මට්ටම අඩුවීම හේතුවෙන් කුළුබඩු අපනයනය ද අඩු විය. 2014 වසරේ පළමු මාස අට තුළ දී, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉතාලිය, ඉන්දියාව සහ ජර්මනිය යන රටවල් ප්‍රධාන අපනයන ගමනාන්තයන් වූ අතර එම රටවල් වෙත සිදු කළ අපනයනවල වටිනාකම මුළු අපනයනයන්ගෙන් සියයට 50 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 1. අපනයන ආදායම**


| වර්ගය | 2013 අගෝ (එ.ජ.ඩො. මිලියන) | 2014 අගෝ (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) | වෙනස්වීමට වූ දායකත්වය (සියයට) |
|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **668.9** | **748.2** | **11.9** | **109.2** |
| රෙදිපිළි හා ඇඟළුම් | 366.5 | 428.6 | 17.0 | 85.6 |
| රබර් නිෂ්පාදිත | 77.7 | 82.4 | 6.1 | 6.5 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 46.6 | 36.2 | -22.4 | -14.4 |
| ප්‍රවාහන උපකරණ | 6.2 | 32.7 | 426.8 | 36.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 27.3 | 32.1 | 17.6 | 6.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 48.3 | 25.3 | -47.5 | -31.6 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 26.7 | 28.1 | 5.2 | 1.9 |
| වෙනත් | 69.7 | 82.8 | 18.8 | 18.1 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **247.1** | **239.4** | **-3.1** | **-10.5** |
| තේ | 142.8 | 138.9 | -2.8 | -5.5 |
| පොල් | 18.7 | 35.0 | 87.1 | 22.5 |
| මුහුදු ආහාර | 19.9 | 19.8 | -0.7 | -0.2 |
| කුළුබඩු | 44.3 | 24.1 | -45.5 | -27.8 |
| වෙනත් | 21.4 | 21.6 | 0.9 | 0.3 |
| **මුළු අපනයන** | **918.6** | **991.3** | **7.9** | **100.0** |


මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## ආනයන ක්‍රියාකාරිත්වය

**2014 අගෝස්තු මාසයේ දී ආනයන සඳහා වූ වියදම එ.ජ.ඩොලර් මිලියන 1,725 ක් දක්වා සියයට 16.9 කින් වර්ධනය වූ අතර සමුච්චිත වශයෙන් සැලකූ විට 2014 වසරේ පළමු මාස අට තුළ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 12,555 ක් දක්වා සියයට 4.6 කින් වර්ධනය විය.** අගෝස්තු මාසයේ දී ආනයන වියදම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව තාප විදුලිබල උත්පාදනය සඳහා පිරිපහදු කළ ඛනිජ තෙල් වැඩිපුර ආනයනය කිරීමය. එමෙන්ම, 2014 අගෝස්තු මාසයේ දී රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ පෞද්ගලික පරිහරණය සඳහා මෝටර් රථ ආනයනය සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වුවද, රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයනයට වඩා රෙදිපිළි හා ඇඟළුම් අපනයන සැලකිය යුතු ලෙස වර්ධනය වීම තුළින් ඇඟළුම් කර්මාන්තය ආනයනික අමුද්‍රව්‍ය මත රඳා පැවතීමේ නැමියාව අඩුවීම සහ එකතු කළ අගය ඉහළ යාම පිළිබිඹු කෙරේ. 2014 අගෝස්තු මාසයේ දී පෞද්ගලික පරිහරණය සඳහා වන රථවාහන ආනයන වියදම ඉහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් මෝටර් රථ හා මෝටර් සයිකල් ආනයනය වැඩිවීම හේතු විය. තවදුරටත්, මෙම මාසය තුළ දී සහල් ආනයනය ද කැපී පෙනෙන ලෙස වැඩි වූ අතර, මෙම වසර තුළ දී දේශීය සහල් නිෂ්පාදනය අඩු වීම මේ සඳහා හේතු විය. 2014 වසරේ පළමු මාස අට තුළ දී, ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය යන රටවල් ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ අතර මුළු ආනයනවලින් සියයට 60 ක් පමණ මෙම රටවලින් සිදු කරන ලදී.

**රූප සටහන 1. අපනයන සහ ආනයන වර්ධනය**



**සංඛ්‍යා සටහන 2. ආනයන වියදම**

| වර්ගය | 2013 අගෝ (එ.ජ.ඩො. මිලියන) | 2014 අගෝ (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) | වෙනස්වීමට වූ දායකත්වය (සියයට) |
|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **266.6** | **327.8** | **23.0** | **24.5** |
| ආහාර හා පාන වර්ග | 101.5 | 121.8 | 19.9 | 8.1 |
| කිරි නිෂ්පාදිත | 27.9 | 23.5 | -15.6 | -1.7 |
| වෙනත් | 73.7 | 98.2 | 33.4 | 9.8 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 165.1 | 206.1 | 24.8 | 16.4 |
| රථවාහන | 68.7 | 102.2 | 48.7 | 13.4 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 32.0 | 31.5 | -1.5 | -0.2 |
| වෙනත් | 64.3 | 72.4 | 12.5 | 3.2 |
| **2. අන්තර් භාණ්ඩ** | **876.5** | **1,061.5** | **21.1** | **74.1** |
| ඉන්ධන | 390.2 | 472.0 | 21.0 | 32.8 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 168.6 | 214.3 | 27.0 | 18.3 |
| රසායනික නිෂ්පාදිත | 60.8 | 69.5 | 14.3 | 3.5 |
| ප්ලාස්ටික් හා උපාංග | 40.9 | 52.8 | 29.1 | 4.8 |
| මූල ලෝහ | 44.7 | 48.0 | 7.6 | 1.4 |
| කඩදාසි සහ ඝන කඩදාසි | 31.2 | 41.7 | 33.4 | 4.2 |
| තිරිඟු හා ඉරිඟු | 29.5 | 40.8 | 38.3 | 4.5 |
| වෙනත් | 110.5 | 122.4 | 10.8 | 4.8 |
| **3. ආයෝජන භාණ්ඩ** | **330.5** | **334.0** | **1.1** | **1.4** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 172.5 | 170.4 | -1.2 | -0.8 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 111.9 | 122.1 | 9.1 | 4.1 |
| ප්‍රවාහන උපකරණ | 45.8 | 41.3 | -9.9 | -1.8 |
| වෙනත් | 0.3 | 0.2 | -36.6 | 0.0 |
| **මුළු ආනයන** | **1,474.9** | **1,724.5** | **16.9** | **100.0** |

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**වෙළෙඳ ශේෂය**

**අපනයන ආදායමට වඩා ආනයන වියදම ඉහළ යාම හේතුවෙන්, වෙළෙඳ හිඟය 2013 අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 556 ට සාපේක්ෂව 2014 අගෝස්තු මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 733 ක් දක්වා පුළුල් විය.** කෙසේ වුවද, සමුච්චිත වශයෙන් සැලකුවිට 2014 වසරේ පළමු මාස අට තුළ දී වෙළෙඳ හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 7.1 කින් අඩු විය.

**සංචාරක ඉපැයුම්**

2014 අගෝස්තු මාසයේ දී සංචාරක පැමිණීම්, 2013 අගෝස්තු මාසයේ දී වාර්තා වූ 123,269 සිට 140,319 දක්වා සියයට 13.8 ක හිතකර වර්ධනයක් වාර්තා කළේය. ඉන්දියාව, එක්සත් රාජධානිය, චීනය, ජර්මනිය සහ ප්‍රංශය සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර පහ වූ අතර 2014 අගෝස්තු මාසය තුළ මෙම රටවලින් පැමිණි සංචාරකයින් ප්‍රමාණය වාර්තා වූ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 47.6 ක් පමණ විය. 2014 අගෝස්තු මාසයේ දී සංචාරක ඉපැයුම්, 2013 අගෝස්තු මාසයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 165.9 සිට එ.ජ.ඩොලර් මිලියන 202.7 දක්වා සියයට 22.2 කින් ඉහළ ගොස් ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මේ අතර, සමුච්චිත පදනම මත සංචාරක පැමිණීම් 2014 අගෝස්තු මස දක්වා සියයට 23.1 කින් වර්ධනය වූ අතර එම කාලපරිච්ඡේදය තුළ දී සංචාරක ඉපැයුම් එ.ජ.ඩොලර් මිලියන 1,447.2 දක්වා සියයට 32.1 කින් වර්ධනය විය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2014 අගෝස්තු මාසයේ දී, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 540 සිට එ.ජ.ඩොලර් මිලියන 548 දක්වා සියයට 1.5 කින් ඉහළ ගියේය. 2014 වසරේ පළමු මාස අට තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 4,515 ක් වූ අතර එය 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී සියයට 10 ක වර්ධනයකි.

**මූල්‍ය ලැබීම්**

2014 අගෝස්තු මස අග දක්වා කාලය තුළ දී රජය වෙත වූ දිගුකාලීන ණය ලැබීම් 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 1,156 සමඟ සැසඳීමේදී එ.ජ.ඩොලර් මිලියන 1,173 ක් විය. 2014 ජනවාරි සිට අගෝස්තු මස අග දක්වා රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 218 ක් වූ අතර, එය පිළිවෙළින් එ.ජ.ඩොලර් මිලියන 37 ක සහ එ.ජ.ඩොලර් මිලියන 181 ක භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙත වූ ශුද්ධ ලැබීම්වලින් සමන්විත විය. 2014 අගෝස්තු මාසයේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ විදේශීය ආයෝජන 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 18 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 28 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. කෙසේ නමුත්, සමුච්චිත පදනම මත 2014 අගෝස්තු මස අග දක්වා කාලය තුළ කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත එ.ජ.ඩොලර් මිලියන 56.7 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. මේ අතර, 2014 වසරේ පළමු මාස අට තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත වූ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 200 ක් විය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2014 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී ගෙවුම් තුලනය 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 66 ක හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 2,150 ක අතිරික්තයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත**

2014 අගෝස්තු මස අග වනවිට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 9.2 ක් වූ අතර බැංකු අංශයේ විදේශීය වත්කම් ඇතුළුව මුළු විදේශීය වත්කම් එ.ජ.ඩොලර් බිලියන 10.7 ක් විය. ආනයනික මාස වශයෙන් සැලකුවිට, 2014 අගෝස්තු මස අග වනවිට දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 5.9 කට සමාන වූ අතර මුළු විදේශීය වත්කම්, ආනයනික මාස 6.9 කට සමාන විය. එ.ජ.ඩොලර් මිලියන 1,694 ක විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ එ.ජ.ඩොලර් මිලියන 517 ක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම සඳහා වූ ගෙවීම් හමුවේ වුවද ජාත්‍යන්තර සංචිත හිතකර මට්ටමක පවත්වා ගැනීමට හැකි වීම වඩාත් කැපී පෙනෙන තත්ත්වයකි. මීට අමතරව, චීන රජයේ මහ බැංකුව සමඟ අත්සන් කළ ද්විපාර්ශ්වික විනිමය හුවමාරු ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව එ.ජ.ඩොලර් බිලියන 1.6 කට සමාන වටිනාකමකින් යුත් චීන රෙන්මින්බි බිලියන 10 ක් සඳහා පහසුකම් ලබාගෙන ඇත. වසර 3 ක කල්පිරීමක් සහිත නැවත අලුත් කළ හැකි මෙම විදේශ විනිමය හුවමාරු පහසුකම ශ්‍රී ලංකා ආර්ථිකයෙහි බාහිර ස්ථායීතාව තවදුරටත් ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**විනිමය අනුපාතිකයේ හැසිරීම**

2014 ඔක්තෝබර් මස 06 දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ.ඩොලරයට එරෙහිව රුපියල සියයට 0.3 ක සුළු අධිප්‍රමාණයක් වාර්තා කරමින් ස්ථාවරව පැවතුණි. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල යූරෝවලට එරෙහිව සියයට 9.8 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 4.4 කින් ද, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 3.1 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 5.3 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 2.5 කින් සහ චීන රෙන්මින්බිවලට එරෙහිව සියයට 1.6 කින් අධිප්‍රමාණය විය. මේ අතර, ශ්‍රී ලංකා රුපියල, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 0.5 කින් අවප්‍රමාණය විය.

**සංඛ්‍යා සටහන 3. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් : 2014 ජනවාරි - අගෝස්තු (අ)**

| | 2013 අගෝ (එ.ජ.ඩො. මිලියන) | 2014 අගෝ (එ.ජ.ඩො. මිලියන) | අගෝ වර්ධනය (සියයට) | 2013 ජන. සිට අගෝ (එ.ජ.ඩො. මිලියන) | 2014 ජන. සිට අගෝ (එ.ජ.ඩො. මිලියන) | ජන. සිට අගෝ වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 918.6 | 991.3 | 7.9 | 6,434.4 | 7,384.9 | 14.8 |
| ආනයන | 1,474.9 | 1,724.5 | 16.9 | 12,002.0 | 12,554.8 | 4.6 |
| වෙළෙඳ ශේෂය | -556.3 | -733.2 | 31.8 | -5,567.6 | -5,170.0 | -7.1 |
| සංචාරක ඉපැයුම් | 165.9 (ආ) | 202.7 | 22.2 | 1,095.4 (ආ) | 1,447.2 | 32.1 |
| අනෙකුත් සේවා වෙළෙඳාම් වෙත වූ ලැබීම් (ඇ) | | | | 1,469.6 (ආ) | 1,670.5 | 13.7 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 540.0 (ආ) | 548.1 | 1.5 | 4,105.6 (ආ) | 4,514.7 | 10.0 |
| කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) | 17.5 | -27.6 | | 151.8 | 56.7 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 342.0 | 200.9 | -41.3 | 3,436.3 | 4,287.0 | 24.8 |
| එයින්: | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 233.9 | 137.2 | -41.4 | 2,257.7 | 1,546.8 | -31.5 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | | | | | 1,500.0 | |
| දිගුකාලීන ණය | 105.6 | 63.2 | -40.2 | 1,156.1 | 1,173.3 | 1.5 |
| විදේශීය සෘජු ආයෝජන (ඇ) | | | | 549.1 | 850.0 | 54.8 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) එක් එක් කාල පරිච්ඡේදය සඳහා අදාළ දත්ත පළමු භාගය සඳහා වේ.
(ඈ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.